# කාව්‍යයේ ස්වභාවය පිළිබඳ පාලි විවරණය

ඇහැලේපොල මහින්ද හිමි[1]

සංස්කෘත භාෂා සාහිත්‍යය පාලි හා සිංහල භාෂා සාහිත්‍යයන්ට ඍජු ආලෝකයක් ලබා දුන්න ද එම සාහිත්‍යයන්ට ආවේණික සාහිත්‍ය සම්ප්‍රදායක් නොමැති බව සිතීම ප්‍රඥාගෝචර නොවේ.පාලි කාව්‍ය විචාර කලාවක් හෙවත් බෞද්ධ කාව්‍ය විචාර සිද්ධාන්ත පද්ධතියක් ගොඩ නඟා ගැනීමේදී සංස්කෘත කාව්‍ය විචාර සිද්ධාන්ත මූල ධර්ම පසෙක තැබීම ද අපහසු කාර්යයකි.පාලි කාව්‍ය විචාර මූලධර්ම ඉදිරිපත් කරන සුබෝධාලංකාරය කාව්‍ය බන්ධය වශයෙන් හඳුන්වන්නේ දෝෂවලින් තොර ශබ්දාර්ථ දෙකයි.එහි දෝෂ ලෙස ගැනෙන්නේ පද වාක්‍ය අර්ථ යන ත්‍රිවිධ දෝෂයන්ය.ඒ අනුව පද දෝෂ අටකි,වාක්‍ය දෝෂ හතකි,අර්ථ දෝෂ හයකි.සියලුම කාව්‍ය දෝෂ විසි එකකි.ගද්‍ය පද්‍ය මිශ්‍ර වශයෙන් කාව්‍යය ත්‍රිවිධය.සුප්‍රකට සංස්කෘත කාව්‍ය විචාරයෙකු වන විශ්වනාථ කාව්‍ය බන්ධය අර්ථ කථනය කර ඇත්තේ එහි රසයට මූලිකත්වය දීමෙනි.ඒ බව "වාක්‍යං රසාත්මකම් කාව්‍යයම්" යන ප්‍රකාශයෙන් පැහැදිලි වේ. කාව්‍ය ශරීරය පසෙකලා කාව්‍ය රසය කාව්‍යයේ ආත්මය වශයෙන් ගැනීම සංස්තෘත කාව්‍ය විචාර සම්ප්‍රදාය වුව ද කාව්‍ය රසයට පෙර කාව්‍ය ශරීරය කාව්‍ය දෝෂවලින් පිරිසිදු කර ගැනීම පාලි කාව්‍යයෙහි ආවේණික ලක්ෂණයකි.කාව්‍ය ගුණ,අලංකාර ආදියෙන් කාව්‍ය ශරීරය සම්පූර්ණව තිබුණ ද උක්ත කාව්‍ය දෝෂ එකකින් හෝ කාව්‍ය බන්ධය සමන්විත වන්නේ නම් ආභරණ පැළැඳිය ද ළප කැළැල් ඇති ස්ත්‍රියක් සේ එම කාව්‍යය දෝෂ සහිත බව බෞද්ධ කාව්‍ය විචාරයෙහි ඉගැන්වේ.(ගුණාලංකාර සංයුත්තා අපි දොසලඞ්ඛිතා.....සා කඤ්ඤා විය තාදිසි) සංස්කෘත කාව්‍ය විචාරය කාව්‍ය රසයට මුල් තැනක් දෙන විට පාලි හෙවත් බෞද්ධ කාව්‍ය විචාරය කාව්‍ය බන්ධයට ප්‍රමුඛස්ථානයක් ලබා දී ඇත. ඒ පිළිබඳ ව විමසා බැලීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණ වේ.

**ප්‍රමුඛ පද**- පාලි කාව්‍යය, කාව්‍ය බන්ධය, සහිතා, දොස වජ්ජිතා

1 පූර්ව උපාධි අපේක්ෂක සිව්වන වසර, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
mahelepola@yahoo.com